# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 2 ශ්‍රේණිය - ගණිතය / දෙවන වාරය / ජුනි මස 2 සතිය

සැකසුම - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

ඒ. එම්. එම්. ඕ. කුමාරි - ර/ ජේසු බිළිඳුගේ කන්‍යාරාම ජාතික පාසල

### 17 පාඩම - කාලය ගතවීම හඳුනා ගැනීම.

1) ඉරටුවකට කහ මල් 10ක් ඇමිණීමට ඔබට ගතවන කාලය අත්පුඩි ගසමින් ගණන් කරන්න. අත්පුඩි ගැසීමට වැඩිහිටියෙකු උදවු කරන්න.

2) මව්බස කියවීම් පොතේ අලුත් නුවණ පාඩමේ පළමු ඡේදය කියවන්න. එයට ගතවන වේලාව බඳුනකට ගල් කැට දමමින් ගණන් කරන්න යැයි තවත් අයෙකුට කියන්න. දැන් දෙදෙනා මාරු වෙමින් එම ක්‍රියාකාරකම කරන්න. ගල්කැට ගණන අනුව අඩුම කාලයක් ගතවූයේ කාට ද?..................................

3) මෙම පළමු චිත්‍රය පාට කරන්න. ගතවන කාලය අත්පුඩි ගසමින් ගණනය කිරීමට වෙනත් කෙනෙකු උදව් කර ගන්න. නැවත දිනයක දෙවන චිත්‍රය පාට කරමින් ගතවන කාලය ගණනය කරන්න. අත්පුඩි ගණන චිත්‍රය යටින් ලියන්න. ගණන අඩු වුවා ද? වැඩි වුවා ද? ..................................

1 චිත්‍රය



අත්පුඩි ගණන..............................

2 චිත්‍රය



අත්පුඩි ගණන..................................

4) පහත ක්‍රියාකාරකම කරන්න.

- පොල් කටුවක් සිදුරු කර ජෑම් බෝතලයක් මත තබන්න. තවත් භාජනයක් හා ගණක හෝ ගල් කැට 10ක් ගන්න.
- පොල් කටුවට වැලි දමා සිදුර තුළින් වැටෙන්නට සලස්වා ඒත් සමග ම ගණක හෝ ගල් කැට එක බැගින් ගණන් කිරීමට පටන් ගන්න.
- ගණක 10 ඉවර වෙන වෙලාවේ ජෑම් බෝතලයේ පිරී ඇති ප්‍රමාණය ලකුණු කර ගන්න.
- නැවතත් බෝතලය හිස් කර පොල් කටුව ඒ මතින් තබන්න. දැන් වැලි දමා ගණක දෙක බැගින් ගෙන ගණන් කරන්න. ගණක 10 ගණන් කර නිමා වන විට වැලි පිරී ඇති ප්‍රමාණය ලකුණු කරන්න.
- වැලි ප්‍රමාණ දෙක සංසන්දනය කරමින් ගණක 10 ගණන් කිරීමට අඩුම කාලයක් ගතවූයේ කුමන අස්ථාවේදැයි බලන්න.
- අඩුම කාලයකින් ගණන් කර නිමා වන්නේ එකෙන් එක ගණන් කිරීමේදී ද? දෙකෙන් දෙක ගණන් කිරීමේදී ද?

...............................................................................................................................